## UNIVERSITY OF PERADENIYA

## CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION

**ශාස්ත්‍රවේදී උපාධි (බාහිර - නව නිර්දේශය) පරීක්ෂණය 200 මට්ටම - 2022**
**கலைத்தேர்வுப் பரீட்சை (வெளிவாரி–புதிய பாடத்திட்டம்) 200 வது தேர்ச்சி மட்டம் – 2022**
**Bachelor of Arts (External - New Syllabus) Examination 200 Level - 2022**

**භාෂණ සහ සංවාද සිංහල ව්‍යවහාරය**
**SUPE 206**

කාලය පැය **(03)** තුනයි.
மூன்று(03) மணித்தியாலங்கள்.
Time three **(03)** Hours.

නොපැහැදිලි අත් අකුරුවලට ලකුණු කපනු ලැබේ.
எழுத்து தெளிவில்லாதவிடத்து புள்ளிகள் குறைக்கப்படும்.
Marks will be deducted for illegible hand writing.

ප්‍රශ්න 05කට පිළිතුරු සපයන්න.
05 வினாக்களுக்கு மட்டும் விடையளிக்க.
Answer 05 questions only.

මෙම ප්‍රශ්න පත්‍රයේ අඩංගු ප්‍රශ්න සංඛ්‍යාව 08කි.
இந்த வினாப்பத்திரத்தில் 08 வினாக்கள் உள்ளன.
There are 08 questions in the question paper.

---

01. පහත දැක්වෙන පින්තූරය ආශ්‍රයෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

I. මේ පින්තූරය ගැන අර්ථවත් වාක්‍ය 10ක් ලියන්න.

II. පහත දැක්වෙන ඒකවචන පදවලට බහුවචන පද ලියා ඒවා ඇසුරින් වාක්‍යයක් බැගින් තනන්න.


බිත්තිය-

ඔරලෝසුව-

පෑන-

මේසය-

පිරිමි ළමයා-



02. පහත දැක්වෙන කථාන්දරය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**රජතුමා හා ඥානවන්ත ඇමතිතුමා**

ඔන්න එකමත් එක කාලෙක ලස්සන පුංචි රටක් තිබුණා. ඒ රටේ මිනිස්සු බොහොම සතුටින් ජීවත් වුණා. ඒකට ලොකු හේතුවක් තිබුණා. හේතුව මොකක්ද දන්නවද? ඒ රට පාලනය කරපු රජතුමා බොහොම යහපත්, කරුණාවන්ත රජෙක් නිසා තමයි මිනිස්සු සතුටින් හිටියේ.

ඔන්න ඉතිං දවසක් මේ රජතුමාට හිතුණා මුළු රට පුරා ම සංචාරය කරන්න ඕන කියල. හැබැයි විශේෂත්වයක් තිබුණා. ඒ මොකක්ද දන්නවද? රජතුමාට තනියෙන් ම තමයි සංචාරය කරන්න ඕනෙ වුණේ. මේ සංචාරයේ එක අරමුණක් තමයි රටේ ජනතාවගේ දුක සැප සොයා බැලීම.

ඊට පස්සේ මේ රජතුමා දවසක් තනියෙන් ම ගමන යන්න පටන් ගත්තා. රජතුමා ගමන ගියේ පයින්මයි. යන අතරමඟ හමුවෙන මිනිස්සුත් එක්ක කතාබහ කරන්න මේ රජතුමා අමතක කරේ නෑ. ඒ මිනිස්සුන්ටත් ගොඩක් සතුටු හිතුණා, තමන්ගේ රටේ රජ්ජුරුවෝ මේ විදියට එයාලගේ දුක සැප බලන්න ආපු එක ගැන.

මේ ගමනේ දී රජතුමා රටේ තිබුණු ලොකු, පොඩි, ප්‍රසිද්ධ, අප්‍රසිද්ධ පන්සල්, දේවාල, කෝවිල්, පල්ලි, ඉස්කෝල එහෙමත් නැරඹුවා. තමන්ගේ රටේ මිනිස්සු ගොඩක් සතුටින් ජීවත් වෙනවා දැකපු රජතුමා ගොඩක් සතුටින් එයාගේ සංචාරය ඉවර කරලා ආපහු රජ වාසලට පැමිණියා.

රජවාසලට ආව රජතුමාගේ කකුල් ඉදිමිලා යටිපතුල් හොඳටම රිදෙන්න පටන් ගත්තා. ඒ මොකද දන්නවද? රටේ පාරවල් ගොඩක් හදලා තිබ්බෙ කළු ගල් තළලා දාලයි. සමහර පාරවල් එහෙමවත් තිබුණේ නැහැ. ඒ නිසා ගොඩක් අමාරුයි ඒවාගේ පයින් ඇවිදින්න.

ඉතිං මේ රජතුමාට ලොකු දුකක් ඇතිවුණා, මහජනයාටත් මේ කටුක මාර්ග හින්දා ගොඩක් වේදනා විඳින්න වෙනවා නේද කියලා. වහාම අමාත්‍ය මණ්ඩලය රැස් කරපු මේ රජතුමා රටේ සියලු ම පාරවල් සම්වලින් ආවරණය කරන්න කියලා අණ කරා.

මුළු රාජ සභාවෙ ම කසුකුසුවක් පැතිරෙන්න වුණා. අමාත්‍ය මණ්ඩලයේ මතය වුණේ රටේ සියලු ම මාර්ග හම්වලින් ආවරණය කරන්න නම් විශාල හම් ප්‍රමාණයක් අවශ්‍ය වෙනවා. ඉතිං ඒ නිසා මේ වැඩේට විශාල මුදල් ප්‍රමාණයක් වැය වෙනවා කියලයි. ඒ බව අමාත්‍ය මණ්ඩලය රජතුමාට කිව්වා.

මේ අතර එක බුද්ධිමත් ඇමති කෙනෙක්, 'රජතුමනි, රටේ සියලු ම මාර්ග හම්වලින් ආවරණය කරනවා වෙනුවට අපි මහජනයාට කියමු එයාලගේ කකුල් හම්වලින් හදපු සපත්තුවලින් ආවරණය කරගෙන මේ මාර්ගවල ගමන් කරන්න කියලා' ඒ ඇමැති කිව්වා.

ඒ ඇමතිතුමාගේ යෝජනාව රාජ සභාවේ හැමෝගේ ම ප්‍රශංසාවට ලක් වුණා. රජතුමාටත් ගොඩක් සතුටුයි. මොකද ඒ යෝජනාව ඇත්තටම හොඳ යෝජනාවක් නිසා. ඉතිං රජතුමා රටවැසියන් හැමෝට ම මේ යෝජනාව ගැන දැනුම් දෙන්න පණිවිඩකාරයෝ යැව්වා. ඒ පණිවිඩය ඇහුව මිනිස්සු රජතුමාගේ නියෝගය අනුව හම්වලින් මැහුව සපත්තු පලඳින්න පටන් ගත්තා.

I. මෙම කථාවේ එන බහුවචන පහක් ලියන්න.

II. මෙම කථාවේ එන ක්‍රියාපද පහක් ලියන්න.

III. මෙම කථාවේ එන නාම විශේෂණ (adjectives) පද පහක් ලියා ඒවාගෙන් වාක්‍ය 5ක් තනන්න.

IV. පහත දැක්වෙන වචනවල තේරුම සරල බසින් ලියන්න.

සංචාරය-

අමාත්‍ය මණ්ඩලය-

කසුකුසුව-

නියෝගය-

ආවරණය-

03. පහත දැක්වෙන ඡේදයේ හිස්තැන්වලට ගැළපෙන වචන **වරහන් තුළින්** තෝරා ලියන්න.

පරිසර දූෂණය යනු අප ජීවත් වන වටපිටාව මිනිසාගේ මෙන් ම සත්ත්වයාගේ වාසයට නුසුදුසු තත්ත්වයට පත්වීමයි. පරිසරය දූෂණය වීමෙන් මිනිසාට විවිධ සෞඛ්‍ය (01)..................... මුහුණ දීමට සිදු වෙනවා. පරිසරයේ දූෂණයට ලක්වන අංග කිහිපයක් තියෙනවා. ඒවා නම් වායු දූෂණය, ජල දූෂණය, භූමිය හෙවත් පස දූෂණය හා ශබ්ද දූෂණය යි. පරිසරය දූෂණය වීමට ප්‍රධාන හේතුව වන්නේ (02) ..................................පිටවන (03).................. පරිසරයට මුදා හැරීමයි. ඊට අමතරව අප විසින් පරිසරයට මුදා හරින පොලිතින්, ප්ලාස්ටික් ආදිය නිසා ද පරිසර දූෂණය සිදු වෙනවා. වායු දූෂණය කියන්නේ අහිතකර සහ විෂ සහිත සංඝටකවලින් (04)...................සංයුතිය වෙනස් වීමයි. වායු දූෂණය නිසා ලෙඩ රෝග ඇති වෙනවා. (05)..................යනු විෂ සහිත හෝ හානිකර ද්‍රව්‍ය එක් වීමෙන් භාවිතයට ගත නොහැකි ලෙස ජලයේ සාමාන්‍ය ස්වභාවය වෙනස් වීමයි. එමගින් ද ලෙඩ රෝග ඇති වෙනවා. භූමි දූෂණය කියන්නේ භූමියේ ස්වාභාවික තත්ත්වය වෙනස් වී භූමිය (06)..................... ගැනීමට නොහැකි අන්දමට වෙනස් වීමයි. භූමි දූෂණය නිසා පසේ (07)...................අඩුවීම හා (08)......................වැනි ආපදා තත්ත්ව ඇති වෙනවා. ශබ්ද දූෂණය ලෙස හඳුන්වන්නේ මිනිසාගේ කනට දැරිය නොහැකි (09).....................යුක්ත ශබ්ද නිකුත් වීමයි. එමගින් පරිසරයේ නිසංසල බව නැති වී යනවා. පරිසර දූෂණය (10).......................සඳහා වන වගාව ආරක්ෂා කිරීම, කසළ නිසිලෙස බැහැර කිරීම, නිසි ප්‍රමිතියක් සහිතව ඉදිකිරීම් සිදු කිරීම ආදිය අනුගමනය කළ හැකි යි.

**(තීව්‍රතාවකින්, ගැටලුවලට, ජල දූෂණය, සාරවත් බව, වායුගෝලයේ, වැළැක්වීම, නායයෑම, කර්මාන්තශාලාවලින්, පරිහරණයට, අපද්‍රව්‍ය)**

04. පහත දැක්වෙන සංවාදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**ජනප්‍රිය නළු මිලින්ද මධුගල්ල සමග සංවාදයක්....**

**ප්‍රශ්නය-** මිලින්ද මේ දිනවල විවිධ චරිතවලින් දකින්න ලැබෙනවා නේද?

**පිළිතුර-** ඔව්. වීදුරු මල්, බන්ධනා, දෙවැනි ඉනිම සහ මැස්සා යන ටෙලි නාට්‍යවල සතියේ දිනවල වගේ ම සති අන්තයේ දිනවලත් මාව දකින්න පුළුවන්.

**ප්‍රශ්නය-** මේ අතරින් ඔබ වඩාත් කැමති චරිතය මොකක්ද?

**පිළිතුර-** මේ චරිත ගත්තොත් එකකට විශේෂ කැමැත්තක් තියෙනව කියල කියන්න අමාරුයි. මොකද ඒවා එකකට එකක් වෙනස්.

**ප්‍රශ්නය-** මැස්සා ටෙලි නාට්‍යයේ මැනේජර් මහත්තයට ලැබෙන ප්‍රතිචාර මොන වගේද?

**පිළිතුර-** මේ දවස්වල වැඩිපුර කතාබහට ලක්වෙන චරිතය තමයි මැස්සා ටෙලි නාට්‍යයේ මැනේජර් මහත්තයා. දෙවෙනි ඉනිම ටෙලි නාට්‍යයෙන් පස්සෙ මට වැඩිපුරම ප්‍රතිචාර ලැබුණෙ මේ චරිතයට.

**ප්‍රශ්නය-** මෙතෙක් පැමිණි ගමන ගැන ඔබ සෑහීමකට පත්වෙනවද?

**පිළිතුර-** ඔව්. ඇත්තටම මට සතුටු වෙන්න පුළුවන්. මොකක්දෝ වාසනාවකට මට ලැබුණ චරිත සහ මුණගැහුණ අධ්‍යක්ෂවරු එකිනෙකට වගේම එකිනෙකාට වෙනස්. ඒ නිසා මට ඉගෙනගන්න ගොඩක් දේවල් තිබුණා. වේදිකාවෙන් පස්සෙ මේ දේවල් එක්ක මම ලොකු පන්නරයක් ලැබුවා. අපිට වඩා ගොඩක් දක්ෂ නළුවෝ ලංකාවේ ඉන්නවා. නමුත් ඔවුන්ට ක්ෂේත්‍රයට එන්නවත් අවස්ථාවක් ලැබිල නැහැ. ඒ අතරින් ගත්තාම මම වාසනාවන්ත බව මට දැනෙනවා.

**ප්‍රශ්නය-** ඔබට වැඩිපුර ආරාධනා ලැබෙන්නෙ ටෙලි නාට්‍යවලට නේද?

**පිළිතුර-** ඔව්. ඒකට හේතුව තමයි මේ දිනවල වැඩි වශයෙන් නිෂ්පාදනය වෙන්නෙ ටෙලි නාට්‍ය. සිනමා නිර්මාණ නිෂ්පාදනයට අර්බුදයක් මතුවෙලා තියෙනව. අපේ රටේ තියෙන ලොකු ම ඛේදවාචකය තමයි වැසීගිය සිනමා ශාලා වෙනුවට එකක් හෝ අලුතින් එකතු නොවීම. තියෙන ඒවායෙත් වැඩි පහසුකම් තියෙන්නෙ කොළඹ තියෙන ශාලාවල විතරයි. මේ හේතු නිසා නිෂ්පාදකවරු අවදානමක් ගන්න කැමති නැහැ. ඒ වගේම මිනිසුන්ටත් ගෙදරදොර ප්‍රශ්නත් එක්ක සිනමා නිර්මාණයක් රසවිඳින්න තරම් මානසිකත්වයක් නැහැ.

**ප්‍රශ්නය-** ටෙලි නාට්‍යයක් හෝ චිත්‍රපටයක් නිෂ්පාදනයට හෝ අධ්‍යක්ෂණයට අදහසක් තියෙනවද?

**පිළිතුර-** ඇත්තටම ටෙලි නාට්‍යයක් නිෂ්පාදනය කරන්න ආසාවක් තියෙනව. චිත්‍රපටයක් නිෂ්පාදනය කරන්න ඊටත් වඩා ආසාවක් තියෙනව. නමුත් එහෙම කරන්න හැකියාවක් තවම නැහැ. අධ්‍යක්ෂණය ගැන කතා කළොත් මම තවම ඒකට සුදුසු නැහැ කියලයි මට හිතෙන්නෙ. මුලින්ම නළුවෙක් වෙලා ඉන්න ඕන. මට තව ඉගෙනගන්න බොහෝ දේවල් තියෙනව කියලයි ඒකෙන් අදහස් කරන්නෙ. මහේන්ද්‍ර පෙරේරා, බිමල් ජයකොඩි සහ දර්ශන් ධර්මරාජ් වැනි අය මට්ටමට එන්න මට තව දුර ගමනක් යන්න තියෙනව.

I. මෙහි සඳහන් ටෙලි නාට්‍ය දෙකක නම් ලියන්න.

II. මිලින්ද මෙහි අගය කර ඇති වෙනත් නළුවන් දෙදෙනෙකු නම් කරන්න.

III. මිලින්ද කියන ආකාරයට ලංකාවේ සිනමා කර්මාන්තයේ ඇති අර්බුදය කුමක්දැයි විස්තර කරන්න.

IV. මිලින්ද තමන් වාසනාවන්ත කෙනෙකු ලෙස හඳුන්වා ගන්නේ ඇයි?

05. I පහත දැක්වෙන පදවලට **සමාන පදයක්** බැගින් ලියන්න. ඉන්පසු එම සමාන පද 10 යොදා ගනිමින් අර්ථවත් **වාක්‍ය 10ක්** ලියන්න.

| | |
|---|---|
| චන්ද්‍රයා- | යාළුවා- |
| වතුර- | පාට- |
| මල- | ගෙදර- |
| ගස- | පාර- |
| පක්ෂියා- | කැලය- |

II පහත දැක්වෙන පදවලට **විරුද්ධ පදයක්** බැගින් ලියන්න. ඉන් පසුව එම විරුද්ධ පද 10 යොදා ගනිමින් අර්ථවත් **වාක්‍ය 10ක්** ලියන්න.

| | |
|---|---|
| උඩ- | දක්ෂ- |
| දුක- | එළිය- |
| පැහැදිලි- | විශාල- |
| එගොඩ- | ප්‍රසිද්ධ- |
| පුහුණු- | ලාභ- |

06. පහත දැක්වෙන මාතෘකාවලින් එකකට අදාළව වාක්‍ය රචනයක් ලියන්න. රචනයට අර්ථවත් **වාක්‍ය 10කට** වැඩි ගණනක් අන්තර්ගත විය යුතු ය.

I. කියවීමෙන් මිනිසා සම්පූර්ණ වේ

II. ශ්‍රී ලංකාවේ ස්වාභාවික සම්පත්


III. ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරය දියුණු කරන්නේ කෙසේද?

IV. දිනපතා ව්‍යායාම කිරීමේ වැදගත්කම

V. මත්ද්‍රව්‍ය හා තරුණ පරපුර

07. පහත දැක්වෙන පින්තූර දෙස බලා ගැළපෙන **නිපාත පදය** (preposition) යොදා වාක්‍ය **10ක්** ලියන්න. අදාළ නිපාත පදය යටින් **ඉරක්** ද අඳින්න.

උදාහරණ- පෙට්ටියක් උඩ කුරුල්ලෙක් ඉන්නවා.




08. පහත දැක්වෙන මාතෘකාවලින් එකකට අදාළව සංවාදයක් ලියන්න. සංවාදයට අර්ථාන්විත **වාක්‍යය 10කට** වැඩි ගණනක් අන්තර්ගත විය යුතු ය.

I. ඔබගේ ජංගම දූරකථනයේ දෝෂයක් නිසා එය නිවැරදි කර ගැනීමට කාර්මික ශිල්පියකුගෙන් උදව් ඉල්ලන අවස්ථාවක්.

II. ඔබගේ විදේශ ගමන් බලපත්‍රය අස්ථාන ගත වී ඇති බැවින් ඒ පිළිබඳ ප්‍රදේශයේ පොලිසියට පැමිණිල්ලක් කරන අවස්ථාවක්.

III. ඔබ හා ඔබගේ මිතුරන් ගංවතුරින් විපතට පත් වූවන්ට සහනාධාර බෙදා දෙන අවස්ථාවක්.

IV. ඔබේ ගමේ ප්‍රසිද්ධ ස්ථානයකට යන පාර ඇසූ කෙනෙකුට එම පාර විස්තර කර දෙන අවස්ථාවක්.

V. පුස්තකාලයෙන් ඔබට සොයා ගැනීමට අපහසු පොතක් සෙවීම සඳහා එහි කාර්ය මණ්ඩලයේ මහත්මයකුගෙන් උදව් ඉල්ලා සිටින අවස්ථාවක්.

(සෑම පිළිතුරකට ම ලකුණු 20 බැගිනි).